ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

පවුල් නීතිය - LWU 2313

කාලය - පැය තුන (03) යි.

---

දිනය - 2006.04.03 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

*ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

01. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනයකට ඉදිරිපත් කිරීම සඳහා, පසුගිය වසර 10 තුළ ද ශ්‍රී ලංකාවේ ළමුන්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා ගනු ලැබූ පියවර පිළිබඳව වාර්තාවක් සැකසීමට ශ්‍රී ලංකා රජය අදහස් කරයි. එම වාර්තාව සකස් කරන ලෙස රජය ඔබෙන් ඉල්ලා ඇත.

ඔබේ වාර්තාවේ කෙටුම්පතක් සකස් කරන්න.

02. උපාධිධාරීන් වන හේරත් සහ කල්පනා රජයේ සේවයේ නිරතව සිටිති. උඩරටියන් වූ ඔවුන් දෙදෙනා තම විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කළහ. 1996 දී ඔවුනට උපත ලද දරුවා පුත්‍රයා සුජිත් ලෙස නම් කරන ලදී. හේරත්ට තම පියාගෙන් අක්කර 5 ක ඉඩමක් උරුම වූ අතර තම ව්‍යාපාරයෙන් ඉපයූ මුදලින් කෙල්දෙණියේ ඉඩමක් ඉදි කළේය. මේ අතර හේරත් විනීතා නම් කාන්තාවක් සමග පැවැත්වූ අනියම් සබඳතාවෙන් උපන් දරුවා කමල් නම් විය. විනීතා විසින් හේරත්ට එරෙහිව පවරන ලද නඩත්තු නඩුවක නියෝගයක් මත හේරත් කමල් වෙනුවෙන් නඩත්තු ගෙවමින් සිටියේ ය.

හේරත් හදිසි අනතුරකින් 2005 දී මිය ගියේය. හේරත්ගේ අන්තිම කැමති පත්‍රයක් රහිත දේපළවල අනුප්‍රාප්තිය ලැබීමට හිමිකම් ඇත්තේ කවරෙකුට දැයි කල්පනා ඔබෙන් විමසයි.

(අ) කල්පනාට උපදෙස් දෙන්න.
(ආ) සියළු පාර්ශ්වයන් සාමාන්‍ය නීතියෙන් පාලනය වූයේ නම් ඔබේ පිළිතුර කුමක් වන්නේ ද?

03. "තේසවලමෙයි නීතියේ තේඩියතේට්ටම් පිළිබඳ මූල් සංකල්පය බොහෝදුරට 1911 යාපනයේ වෛවාහක අයිතිවාසිකම හා උරුම ආඥාපණතින් වෙනස් කරනු ලැබ ඇත."

1911 සිට 1947 කාලය තුල දී ඇති කරන ලද ව්‍යවස්ථාපිත වෙනස්කම් සහ නඩු නීතිය ඇසුරෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

04. මහේන්ද්‍රන් හා දේවි තේසවලමෙයි නීතියෙන් පාලනය වෙති. මහේන්ද්‍රන්ගේ දෙමාපියන් විසින් ගෙන එනු ලැබූ විවාහ යෝජනාවක් මත අවුරුදු 20 ක් වයසැති මහේන්ද්‍රන් හා අවුරුදු 16 ක් වයසැති දේවි අතර විවාහය පිළියෙල කරන ලදී. ඔවුනගේ විවාහය පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු මත විවාහ ලේකම්වරයෙකු විසින් 1998 දී ලියාපදිංචි කරනු ලැබිය.

විවාහයෙන් පසු දෙදෙනා මහේන්ද්‍රන් විසින් කුලියට ගනු ලැබූ නිවසක අඹු සැමියන් වශයෙන් ජීවත් වූහ. 2001 දී ඔවුනට රාජු නම් දරුවකු ලැබුණි. 2003 දී තම බිරිඳ හා දරුවා අත්හැරගිය මහේන්ද්‍රන් ඔවුන්ට මුදල් දීම ප්‍රතික්ෂේප කළේය. මහේන්ද්‍රන්ගෙන් තම නඩත්තුව සඳහා යම් මුදල් උපකාරයක් ලබා ගත හැකි දැයි දේවි ඔබෙන් විමසයි.

(අ) දේවිට උපදෙස් දෙන්න.

(ආ) පාර්ශ්වයන්

(i) උඩරටියන් වූයේ නම්

(ii) මුස්ලිම් ජාතිකයන් වූයේ නම්

නෛතික තත්ත්වය කුමක් වන්නේ ද?

05. රමානා සහ හුසේන් මුස්ලිම් නීතිය යටතේ විවාහ වූ මුස්ලිම් යුවලකි. ඔවුනට අවුරුදු 16 ක දියණියක් සහ අවුරුදු 6 ක් වයසැති පුත්‍රයෙකු සිටිති. ව්‍යාපාරිකයෙකු වූ හුසේන් සතියේ දින 7 දීම සාමාන්‍යයෙන් පෙරවරු 6 ට නිවසින් පිටත් වී රාත්‍රී 11 ට පමණ නිවසට පැමිණෙයි. රමානා කිසිදු කාර්යයක් සඳහා නිවසින් පිටත්ව යාම පිළිබඳව අකමැත්තක් දැක්වූ හුසේන් ඇයට සියළු දේ සපයා දුන්නේ ය. පුත්‍රයා නිවස අසළ කුඩා පාසලෙන් ඉවත්කොට කොළඹ ප්‍රකට මුස්ලිම් විදුහලකට ඇතුලත් කිරීමට රමානාට අවශ්‍ය වුව ද ඒ සඳහා රජයේ නිළධාරීන් පසුපස යාමට තමනට වේලාවක් නැති බව හුසේන් පැවසීය. පවුල කෙරෙහි හුසේන් තුළ උනන්දුවක් නොමැතිවීම පිළිබඳව රමානා නිතරම පැමිණිලි කළාය. දිනක් දෙදෙනා අතර ආරවුලක් ඇති වූ අවස්ථාවක දී ළමුන් නිවසේ තබා නිවසින් පිට වී යන ලෙස හුසේන් රමානාට නියෝග කළේය. නිවසින් පිටව ගිය රමානා සිය දෙමාපියන් සමග ජීවත් වීමට ගියාය. කෑම පිසීම සහ නිවස බලා ගැනීම සඳහා අවුරුදු 18 ක මුස්ලිම් තරුණයෙකු සේවයේ යෙදවූ හුසේන් දිවා කාලයේ දී රමානා වෙනුවෙන් පවා නිවසේ ගේට්ටුව විවෘත නොකරන ලෙස ඔහුට නියෝග කළේය.

දරුවන්ට බෙහෙවින් ආදරය කළ රමානා ඔවුන්ගේ භාරකාරත්වය ලබා ගැනීමට අදහස් කරයි.

(අ) රමානාට උපදෙස් දෙන්න.

(ආ) පාර්ශ්වයන් සිංහල ජාතිකයන් හා සාමාන්‍ය නීතියෙන් පාලනය වූයේ නම් ඔබේ පිළිතුර කුමක් වන්නේ ද?

06. මගුල් කපුවකු විසින් ගෙන එනු ලැබූ විවාහ යෝජනාවක් මත සමන් හා රුවන්මලී වර්ෂ 2000 දී සාමාන්‍ය නීතිය යටතේ විවාහ වූහ. කෙටි දුර ධාවන ශූරියක වූ රුවන්මලී ජාත්‍යන්තර ක්‍රීඩා තරග කිහිපයක දී ශ්‍රී ලංකාව නියෝජනය කළාය. රුවන්මලී කන්‍යාවක නොවන බව විවාහ වූ දිනයේ දී සමන් දැන ගත්තේය. ඉන්පසු ඔහු මෙම කරුණ පිළිබඳව නිතරම රුවන්මලී සමග දබර විය. තම නිවසට පැමිණි මිතුරන් ඉදිරියේ දී පවා ඔහු මේ බව පවසමින් ඇය අවඥාවට ලක් කළේය. සමන් සමග ජීවත් වූ සමන්ගේ මව රුවන්මලීට වෙනස්කම් කළාය. රුවන්මලීගේ නරක චරිතය නිසා ඇයට එවැනි සැලකුම් ලැබිය යුතු බව පවසමින් සමන් තම මවගේ ක්‍රියාකලාපය අනුමත කළේය. 2003 දී තම දෙමහල් නිවසේ වෙනම කාමරයක ජීවත්වීමට ගිය සමන් එහි රුවන්මලී සමග ගත කිරීම ප්‍රතික්ෂේප කළේය. රුවන්මලී වෙනුවෙන් කෑම පිළියෙල නොකරන ලෙස හා තම ආහාර තමන් විසින් ම පිළියෙල කර ගන්නා ලෙස ඇයට දන්වන ලෙස සමන් තම මවට නියෝග කළේය. මෙම වෙනස්කම් දරා ගැනීමට නොහැකි වූ රුවන්මලී තම දෙමාපියන් සමග ජීවත්වීමට ගියාය. තමාට ලබා ගත හැකි වෛවාහක සහන මොනවාදැයි ඇය ඔබෙන් විමසයි.

රුවන්මලීට උපදෙස් දෙන්න.

07. 1895 අංක 14 දරණ සාක්ෂි ආඥාපණතේ 112 වන වගන්තියේ සඳහන් "ප්‍රවේශය නොමැති වීම" යන වදන පිළිබඳ අධිකරණමය අර්ථ නිරූපනයේ වැදගත් වර්ධනයන් වර්තමානය දක්වා සිදු වූ ආකාරය සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් කරුණු අතරින් ඕනෑම දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(අ) සහවාසයෙන් සහ ප්‍රසිද්ධියෙන් ඇති වූ විවාහය නම් සංකල්පය පිළිබඳ අධිකරණමය අර්ථ නිරූපනයේ වර්ධනයන්

(ආ) දරුවාගේ උපරිම යහපත පිළිබඳ සංකල්පය

(ඇ) සාමාන්‍ය නීතිය යටතේ විවාහය ශූන්‍යතාව සඳහා කරුණු

(ඈ) අත්හැර දමනු ලැබූ භාර්යාවකට රෝම ලන්දේසි නීතිය යටතේ ඇති අයිතිවාසිකම්.

- හිමිකම් ඇවිරිණි. -